**ශීර්ෂය 121 - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

**ශීර්ෂය 121 -** ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 26 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 22,206.86 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 13,617.82 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 8,589.04 ක් හෙවත් සියයට 38.68 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 9,440.88 | 7,602.39 | 1,838.49 | 19.47 |
| මූලධන | 12,765.98 | 6,015.43 | 6,750.55 | 52.87 |
| එකතුව | 22,206.86 | 13,617.82 | 8,589.04 | 38.68 |

**2.2** **ආදායම් ගිණුම**

**----------------**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**--------------------------------------**

අමාත්‍යාංශය විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 10.03.07.99 ට සඳහා එකතුව රු.මිලියන 169.82 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 199.69 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 117.60 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ආදායම් සංකේතය** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉක්මවීම (ඌනතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ඇස්තමේන්තුගත ආදායම** | **තථ්‍ය ආදායම** | **ඉක්මවීම/ (ඌනතාවය)** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.03.07.99 | 169.82 | 199.69 | 29.87 | 17.60 |

**2.3** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**----------------------------------------------------**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 12101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 300.00 | 295.53 | 180.00 | 188.39 | 700.00 | 389.54 |

**2.4** **අග්‍රිම ගිණුම**

**--------------**

අමාත්‍යාංශය යටතේ වු 7002/0000/00/0061/0016/000 අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට රු.660,552 ක ශේෂයක් නිරීක්ෂණය විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 05 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 6.41 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0016/0070/000 | 12,432 |
| 6000/0000/00/0001/0091/000 | 68,000 |
| 6000/0000/00/0013/0081/000 | 328,881 |
| 6000/0000/00/0002/0121/000 | 5,043,412 |
| 6000/0000/0008/0012/000 | 955,688 |
| එකතුව | **6,408,413** |

## 2.6 විගණන නිරීක්ෂණය

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 (1) | පවත්වා නොතිබුණි. |
| (ඇ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන වැය විෂයන් 03ක් සඳහා සලසා තිබුණු එකතුව රු.5,700,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන් ඉතිරි කර තිබුණි.

(ආ) පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයන් 14 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එකතුව රු.මිලියන 7,722.67 ක් වූ එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 18 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 ආදායම් ගිණුම්**

අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් 10-03-07-99 දරන ආදායම් සංකේතයට අදාළ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 169.82 ක ආදායමක් රැස්කිරීමට ඇස්තමේන්තු කර තිබූ අතර, රැස්කර තිබූ ආදායම රු.මිලියන 199.69 ක් විය. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සේවාලාභීන්ගේ අවශ්‍යතා මත නිකුත් කරනු ලබන මාසික ආදායම් සහතික, වාර්ෂික ආදායම් සහතික, වටිනාකම් සහතික හා බලපත්‍ර පිටපත් සඳහා අයකරනු ලබන ගාස්තු මඟින් එකතු කරන ආදායම වැඩිවීම හේතුවෙන් ඇස්තමේන්තුගත ආදායමෙන් 117 ක ආදායමක් රැස් කර ගැනීමට හැකි වී තිබුණි. කෙසේ වුවද, මුල් ඇස්තමේන්තුව සංශෝධනය කරන ලද දිස්ත්‍රික් ලේකම් කාර්යාල 4 ක මෙන්ම මුල් ඇස්තමේන්තුව සංශෝධනය නොකරන ලද තවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයක ඇස්තමේන්තුගත ආදායම් ඉලක්කයන් සම්පූර්ණ කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 12101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.10,306,649 ක් වී තිබුණි. එම හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් ඉදිරිපත්කර නොතිබුණු අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 20 ක රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමට අදාළව භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂ අතර රු.287,150 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) සාමාජික ණය ලේඛනයේ හා සැසඳුම් ප්‍රකාශය අනුව නිලධාරීන් 10 දෙනෙකුගේ කේවල ණය ශේෂවල එකතුවෙහි රු. 119,263ක වෙනසක් නිරීක්ෂණය විය .

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල 15 කට ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ රු.6,158,294 ක ණය ශේෂ පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 06 දෙනෙකුගේ රු.38,500ක ණය ශේෂය පවරා ගෙන වාරික අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් බැහැරව රු.250,000ක සීමාව ඉක්මවා එක් නිලධාරීයෙකු වෙත රු.253,780ක් ආපදා ණය ගෙවා තිබුණි.

## 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

### 3.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වගන්තිය අනුව අමාත්‍යාංශයේ සංවිධාන සටහන, අනුමත කාර්ය මණ්ඩලය යනාදී තොරතුරු ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 3.5.2 අභ්‍යන්තර විගණනය

---

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණද කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම, විගණන ක්‍රියාවලියට බාධාවක් වී තිබුණි.

### 3.5.3 විගණන හා කළමනාකරණ කමිටුව

---

සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබු නමුත්, ප්‍රධාන ගණන් දීමේ නිළධාරීගෙන් ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොතිබුණු බැවින් කමිටුවලදී ගන්නා ලද තිරණවල වලංගුතාව පිළිබද සෑහීමකට පත් විය නොහැකි විය.

**3.6 වත්කම් කළමනාකරණය**

---------------------------

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව රු.මිලියන 1,031.33 ක් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, වාර්තාව ඉදිරිපත් කර තිබුණේ 2017 ජුනි 28 දිනය.

(ii) ඉහත චක්‍රලේඛයේ 3.1.4 පරිදි භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් කටයුතු නිම කර 3.1.5 ඡේදය පරිදි කටයුතු කළ යුතුව ඇතත් සමාලෝචිත වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් අනාවරණය වී තිබුණු අංශ 12ක අතිරික්ත භාණ්ඩ අයිතම 133 ක් හා අංශ 12ක ඌනතා භාණ්ඩ අයිතම 370 ක්ද සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-----------------------------------------

අමාත්‍යාංශයට අයත් ඩබල් කැබ් රථයක් හා ඩිෆෙන්ඩර් රථයක් හිටපු නියෝජ්‍ය අමාත්‍යවරයෙකු රැගෙන ගොස් තිබුණු අතර එම වාහන දෙක අදාළ අමාත්‍යාංශය වෙත භාර දීම හෝ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට භාර දීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

---------------------------------------------------------

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.39,641,418 ක් වටිනා ජංගම නොවන වත්කම් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලබාදී ඇති බව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ මාරු කිරීම් යටතේ දක්වා තිබුණද, ඒවා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට පවරාගෙන නොතිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂයට අඩු බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.මිලියන 53.15 ක් විය.

(ii) මුදල් රෙගුලාසි 94 විධිවිධානවලට පටහැනිව වැය විෂයයන් 08 ක් සඳහා ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා වටිනාකම රු.මිලියන 16.17 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.7 අනුකූල නොවීම්

-----------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------

අමාත්‍යාංශයේ වාහන 6 ක් අවස්ථා 13 කදී අනතුරට භාජනය වී වටිනාකම රු. 3,810,988 ක අලාභයක් අය වීමට තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104, 105 ප්‍රකාරව පරීක්ෂණ මණ්ඩල පත් කර පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අතර, වගකිව යුත්තන්ගෙන් අලාභයන් අය කර ගැනීමට හෝ ඔවුනට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.8 කාර්යසාධනය

-----------------

2016 වර්ෂයේ කාර්යසාධන වාර්තාව අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------

අමාත්‍යාංශය ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) කලවාන, කතරගම, උකුවෙල හා කරුවල ගස්වැව යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගොඩනැගිලි ඉදිකිරීම් සහ පිබිදෙමු පොලොන්නරුව වැඩසටහන සඳහා පිළිවෙලින් රු. මිලියන 69.13 ක් හා රු. මිලියන 9,400 ක් වෙන් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. එම වැඩසටහන්වල මූල්‍ය ප්‍රගතිය 0 ක සිට සියයට 65 ක් දක්වා පරාසයක පැවතුණු බැවින් අපේක්ෂිත කාර්යයන් ප්‍රමාණවත්ව ඉටු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ii) කාර්මික නිලධාරී තනතුර හා තාක්ෂණ සහායක තනතුර සඳහා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම හා පළාත් මට්ටමින් කාර්මික නිලධාරීන් සහ තාක්ෂණ සහායකයින් සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කර තිබුණද ඒවා ක්‍රියාත්මක වී නොතිබුණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

------------------------------

සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 43.79 ක් වැයකර ග්‍රාම නිලධාරී තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වූ විභාගය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේදී පැවති තනතුරු 1000 කට ආසන්න පුරප්පාඩු ප්‍රමාණයක් පිරවීමට 2016 පෙබරවාරි 12 දින ගැසට් නිවේදනයක් පලකර තිබුණි. 2016 සැප්තැම්බර් 03 දින පැවැත්වූ විභාගයේ ප්‍රතිඵල 2016 නොවැම්බර් මාසය අවසාන වනවිට ලබා දීමට හැකියාව ඇති බව විභාග කොමසාරිස් ජනරාල්වරයා

විසින් දන්වා තිබුණි. එසේ වුවද , විභාගය පවත්වා මාස 10ක් ගත වී තිබුණද බඳවා ගැනීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු 2017 ජූලි 31 දින වනවිටත් සිදුකර නොතිබුණි.

**(ආ)** ජනතාවට වඩා සමීප වූ රාජ්‍ය සේවාවන් ස්ථාපිත කිරීම සහ පවත්වාගෙන යාමේ අරමුණ ඉටුකරනු ලබන ග්‍රාම නිලධාරීන් 2017 අප්‍රේල් මාසය වන විට අනුමත 14,022 ක තනතුරු අතරින් 2000 කට ආසන්න තනතුරු ප්‍රමාණයක් පුරප්පාඩුව පැවතීම තුළ එම අරමුණු ඉටු කර ගැනීමට බාධා වී තිබුණි. මාස 03ක කාලයක් සඳහා විශ්‍රාමික ග්‍රාම නිළධාරීන් 79 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කර ඇති බව ලේකම්වරයා දන්වා තිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 30 | 22 | 08 | - |
| (ii) | තෘතියික මට්ටම | 07 | 04 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 155 | 127 | 31 | 03 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 65 | 10 | - |
| | **එකතුව** | **267** | **218** | **52** | **03** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේදී පවරා ගන්නා ලද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් 15,639 ක් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 52 ක් පිරවීමට කටයුතු කර නොතිබුණ අතර, ජ්‍යෝෂ්ඨ හා තෘතියික මට්ටම්වල තනතුරු සියයට 30ක පුරප්පාඩු පැවති බව නිරීක්ෂණය විය.